ප්‍රතිපත්ති සටහන

## ජාත්‍යන්තරව පිළිගත් ශ්‍රී ලාංකික සන්නාමයන් ගොඩනැගීමේ ඉදිරි පියවරක් ලෙස

# වෙළඳ ලකුණු ලියාපදිංචිය සඳහා සරළ ක්‍රමවේදයක් හඳුන්වාදීම


**සාරාංශය**

ශ්‍රී ලංකාවේ අපනයන ආදයම වැඩිකිරීම සඳහා "අගය එකතු කළ" නිෂ්පාදනයන්ගේ ඇති වැදගත්කම පිළිබඳව තීව්‍ර ප්‍රතිපත්තිමය සංවාදයක් පවතී. එසේවුවත්, අගය එකතු කිරීමේ ක්‍රමවේදයක් ලෙස සන්නාමකරණයේ ඇති වැදගත්කම පිළිබඳව තවමත් නිසි ප්‍රතිපත්තිමය අවධානයක් යොමු වී නොමැත. සන්නාමකරණයේ සාර්ථකත්වය යමෙකුගේ සන්නාමය ආරක්ෂා කර ගැනීමේ හැකියාව මත දැඩිව රඳා පවති. මෙහිදී වෙළඳ ලකුණු ලියාපදිංචි කිරිමට ඇති හැකියාව ඉතා වැදගත් වේ. යම් සන්නාමයක නමද එහි නිල ලකුණද වෙළඳ ලකුණෙන් පිළිබිඹු වන අතර, සන්නාමයන් අනවසර ලෙස පිටපත් කිරීමට එරෙහිව නීතිමය රැකවරණයක් වෙළඳ ලකුණ ලියාපදිංචිය තුළින් ලැබේ.

ශ්‍රී ලංකාව ව්‍යාපාර සන්නාමකරණය කරා වඩ වඩා යොමුවෙමින් සිටී. ගෙවුණු දශකය තුළ දේශියව මෙන්ම විදේශීයව ද වෙළඳ ලකුණු ලියාපදිංචිය කෙරෙහි ශ්‍රී ලාංකිකයන් ගෙන් ඇති වූ ඉල්ලුමේ ඉහළ යාම මෙම ප්‍රවණතාවයේ පිළිබිඹුවකි.

වෙළඳ ලකුණුවලට නීතිමය රැකවරණය ලබා ගැනීමට අපනයනකරුවන්, තම රටෙහි මෙන්ම අපනයනය කරන රටවල්වලද තම වෙළඳ ලකුණු ලියාපදිංචි කළ යුතුය. නමුත් විදේශ රටක තම වෙළඳ ලකුණ ලියාපදිංචි කිරීම දිගු කාලයක් වැයවන, වියදම්කාරී සහ දුෂ්කර කර්තව්‍යයකි. මෙම දුෂ්කරතාවයන් හා පිරිවැය පිළිබඳව බොහෝ ශ්‍රී ලාංකික ව්‍යාපාර මැසිවිලි නගා ඇත. මැඩ්රිඩ් ප්‍රොටෝකෝලයේ සාමාජිකත්වය ලබා ගැනීමට 2015 වසරේ දී රජය තීරණය කළේ මේ පසුබිම තුළ ය.

මැඩ්රිඩ් ප්‍රොටෝකෝලය යනු වෙළඳ ලකුණු විදේශයන්හි ලියාපදිංචිය සඳහා ඇති සරල, ගෝලීය ක්‍රමවේදයකි. ශ්‍රී ලාංකික ව්‍යාපාරවලට වෙළඳ ලකුණු විදේශ රටවල ලියාපදිංචියේ දී මුහුණ දීමට සිදුවන දුෂ්කරතාවයන් එමගින් සමනය කර ගත හැක.

මැඩ්රිඩ් ප්‍රොටෝකෝලයෙන් ප්‍රතිලාභ ලබා ගැනීමේදී, වෙළඳ ලකුණු ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි කිරීම තීරණාත්මක පළමු පියවරකි. නමුත් ව්‍යාපාරවලට තම වෙළඳ ලකුණු ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි කිරීමේදී මුහුණ දීමට සිදුවන ප්‍රමාදයන් සහ දුෂ්කරතා සඳහා විසඳුමක් මැඩ්රිඩ් ප්‍රොටෝකෝලය හා එක්වීමෙන් නොලැබෙනු ඇත. එසේම සෑම වසරකම, පුළුල් වන දේශීය වෙළඳ ලකුණු ලියාපදිංචිය සඳහා ඉදිරිපත් වන ඉල්ලුම් පත් සංඛ්‍යාව සහ ලියාපදිංචිය සිදු කෙරෙන වෙළඳ ලකුණු සංඛ්‍යාව අතර පරතරය කෙරෙහි ද ඉන් බලපෑමක් ඇති නොවනු ඇත. එහෙත් මෙම ගැටළුවට විසඳුමක් ලබා දීමට අපොහොසත් වීම, මැඩ්රිඩ් ප්‍රොටෝකෝලය හා එක්වීමෙන් අත්වන වාසි සීමා කිරීමට හේතු වනු ඇත.


**ප්‍රධාන නිශ්චයන්**

▪ ශ්‍රී ලංකාවේ වෙළඳ ලකුණු සඳහා ඇති ඉල්ලුම ඉහළ යමින් පවතී. දේශීයව මෙන්ම විදේශීයව ද වෙළඳ ලකුණු ලියාපදිංචිය සඳහා ශ්‍රී ලංකාවේ ව්‍යාපාර තුළ පවතින ඉල්ලුම පසුගිය දශකය තුළ දී කැපී පෙනෙන ලෙස ඉහළ ගොස් ඇත.

▪ මැඩ්රිඩ් ප්‍රොටෝකෝලයෙන් ශ්‍රී ලංකාවට ප්‍රතිලාභ අත්විය හැකිය.

මැඩ්රිඩ් ප්‍රොටෝකෝලය සමඟ එක්වීම තුළින් වෙළඳ ලකුණු විදේශයන්හි ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය සරල, කඩිනම්, අනුමාන කල හැකි හා අඩු පිරිවැය ක්‍රියාවලියක් බවට පත් වේ. ප්‍රොටෝකොලයේ සාමාජික රටවල් එම ප්‍රොටෝකෝලය හරහා එන සියළු විදේශීය ඉල්ලුම්පත් වසර 1-1.5ක් ඇතුළත සැකසුම් කෙරෙන බවට සහතික වේ. කෙසේ වෙතත් දේශීයව සිය රටෙහි ලියාපදිංචියට ඉදිරිපත් කරන ඉල්ලුම්පත් සැකසීම සඳහා නිශ්චිත කාල රාමුවක් ඉන් නොපැන වේ.

▪ ශ්‍රී ලංකාව තුළදී මුහුණදීමට ඇති අභියෝගතා මැඩ්රිඩ් තුලින් ලැබිය හැකි ප්‍රතිලාභ සීමා කරවයි.

මැඩ්රිඩ් ක්‍රියාවලිය හරහා වෙළඳ ලකුණු විදේශයක ලියාපදිංචි කිරීමේ දී ගත යුතු පළමු පියවර වන්නේ එම

ප්‍රතිපත්ති සටහන

වෙළඳ ලකුණු සිය රට තුළ ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කිරීමයි. වර්තමානයේ දී, ශ්‍රී ලංකාව තුළ වෙළඳ ලකුණක් ලියාපදිංචි කිරීමේ ඉල්ලුම් පතක් සැකසුම් කිරීමට ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයට (ජා.බු.දේ.කා) වසර 3-5 දක්වා කාලයක් ගත වේ මෙම ප්‍රමාදය නිරාකරණය කර ගැනීමට අසමත්වීම, මැඩ්රිඩ් ප්‍රොටෝකෝලය හරහා ලබාගැනීමට බලාපොරොත්තු වන ප්‍රතිලාභ සීමා කිරීමට හේතු වනු ඇත.

- කාර්යක්‍ෂම ජා.බු.දේ.කා.ක් නොමැතිව මැඩ්රිඩ් ප්‍රොටෝකෝලයට එක්වීම දේශීය ව්‍යාපාරවලට අවාසියක් විය හැක.

වෙළඳ ලකුණු ලියාපදිංචිය සඳහා ලැබෙන විදේශීය ඉල්ලුම්පත් වසර 1.5 ක් ඇතුළත සැකසුම් කිරීමට මැඩ්රිඩ් ප්‍රොටෝකෝලයේ සාමාජික රටවල් නීතිමය වශයෙන් බැඳී සිටී. එහෙත් දේශීය ඉල්ලුම්පත් සැකසුම් කිරීම සඳහා ඒ හා සමාන නියමයක් පැනවී නොමැත. මෙම පසුබිම තුළ, මැඩ්රිඩ් සාමාජිකත්වය සමග ඉල්ලුම්පත් සලකා බැලීමේදී දේශීය ඉල්ලුම්පත්වලට වඩා විදේශීය ඉල්ලුම්පත්වලට ප්‍රමුඛතාවයක් ලබා දීමට ඇති ඉඩකඩ වැඩිය. මෙය දේශීය ඉල්ලුම්පත් සැකසීම තවදුරටත් ප්‍රමාද වීමට හේතුවිය හැක. මෙය දේශීය ව්‍යාපාරයන්ට අවාසිදායක තත්ත්වයක් උදා කරයි.

### නිර්දේශයන්:

'මැඩ්රිඩ්' සාමාජිකත්වය තුළින් උපරිම ප්‍රතිලාභ අත්පත් කර ගැනීමට නම් ජා.බු.දේ.කා. වඩා කාර්යක්‍ෂම තත්වයකට පත් කරලීම ඉතා වැදගත්ය. පහත ප්‍රතිපත්තිමය නිර්දේශයන් ඉදිරිපත්කර ඇත්තේ මෙම අරමුණ පෙරදැරි කරගෙනය.

1. ජා.බු.දේ.කා. හි කාර්ය සාධනය පිළිබඳ සමාලෝචනයක් ව්‍යාපාර හා වාණිජ්‍යය පිළිබඳ පාර්ලිමේන්තු ආංශික අධීක්‍ෂණ කමිටුව හරහා සහ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය හරහා කාර්තුවක් පාසා සිදු කිරීම. මෙම සමාලෝචනයේ අරමුණ විය යුත්තේ වෙළඳ ලකුණු දේශීයව සැකසීමට ගතවන කාලය වසර 1.5ක් වන බවට තහවුරු කර ගැනීමත්, සැකසීමේ ඇති ප්‍රමාදයන් නිසා ගොඩ ගැසී ඇති දේශීය ඉල්ලුම්පත් සංඛ්‍යාව අඩු කර ගැනීමත්, අන්තර්ජාතිකව පිළිගත් සම්මතයන්ට අනුකූලව කාර්යන්ශයේ සේවා සැපයීම සිදුවන බව තහවුරු කර ගැනීමත් ය.
2. වෙළඳ ලකුණු දේශීයව ලියාපදිංචි කිරීම පහසු කිරීමට අන්තර්ජාලය හරහා පිරික්සුම් සිදු කළ හැකි දැනට ලියාපදිංචි කර ඇති සියලු වෙළඳ ලකුණු පිළිබඳ තොරතුරු ඇතුළත් පොදු දත්ත ගබඩාවක් ස්ථාපිත කිරීම. එවැනි දත්ත ගබඩාවකින් දේශිය ඉල්ලුම්කරුවන්ගේ කාලය හා පිරිවැය ඉතිරි වනු ඇත්තේ දැනට ලියාපදිංචි වී ඇති වෙළඳ ලකුණු ගැටෙන අන්දමේ ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමෙන් වැළකීමට එය ඉවහල් කර ගත හැකි නිසාවෙනි. අයදුම්පත් සැකසුම් කිරීමේ දී ජා.බු.දේ.කා.ට ඉසිලීමට සිදුවන වැඩ ගොන්න ද ඉන් අඩු වනු ඇත.

### පර්යේෂණ සාරාංශය

**වෙළඳ ලකුණු ලියාපදිංචිය සඳහා ඇති ඉල්ලුම ගෙවුණු වසර ගණන තුළ ඉහළ ගොස් ඇත.**

වෙළඳ ආයතන විසින් ස්වකීය නිෂ්පාදන අනෙක් ඒවායින් වෙන්කර දැක්වීම සඳහා යොදා ගන්නා සුවිශේෂි හඳුනා ගැනීමේ සලකුණු වන වෙළඳ ලකුණු, වෙළඳපොළ තුළ ව්‍යාපාරයක සන්නාම ප්‍රතිරූපය පිළිඹිබු කරයි. එබැවින්, ලියාපදිංචිය හරහා වෙළඳ ලකුණු ආරක්‍ෂා කරගැනීම, සන්නාමයක් ගොඩනැගීම සඳහා කාලයක් තිස්සේ යොදවන ලද ආයෝජනයන්ගෙන් ලැබීමට බලාපොරොත්තු වන ප්‍රතිලාභ සුරක්ෂිත කර ගැනීමෙහිලා තීරණාත්මක පියවරකි. දේශීයව හා විදේශීයව තම නිෂ්පාදන හා සේවාවන්වල සන්නාමයන් හරහා තරඟකාරී වාසියක් අත් කර ගැනීමට බලාපොරොත්තු වන ව්‍යාපාරයන්ට මෙය විශේෂයෙන්ම වැදගත් ය. ලියාපදිංචි කිරීමෙන් තොරව වෙළඳ ලකුණක් භාවිතා කිරීම මඟින් ව්‍යාපාරවලට තමන් දුෂ්කර ලෙස ගොඩ නඟා ගත් කීර්තිනාමය පළුදු වීමේ අවදනමට මුහුණ දීමට සිදු වේ.

වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීම සඳහා ශ්‍රී ලාංකික ව්‍යාපාර විසින් ඉදිරිපත් කෙරෙන ඉල්ලුම මෑත වසරවලදී ඉහළ ගොස් ඇත. ජා.බු.දේ.කා. හා ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (ලෝ.බු.දේ.සං.) විසින් ප්‍රකාශයට පත් කර ඇති දත්ත අනුව, දේශීය වෙළඳ ලකුණු ඉල්ලුම්පත් සංඛ්‍යාවේ පසුගිය දශකයේ වාර්ෂික සාමාන්‍ය අගය ඊට පෙර දශකය හා සැසඳීමේ දී 40% කට වැඩි ඉහළ යාමක් පෙන්නුම් කර තිබේ (උදා. 1996-2005 කාලය සඳහා ඉල්ලුම්පත් 3,215ක සාමාන්‍යයක සිට 2006-2015 තුළදී 4,541ක සාමාන්‍යයක් දක්වා). මෙම විමර්ශන කාල රාමුව තුළදීම ශ්‍රී ලාංකික ව්‍යාපාර විසින් ඉදිරිපත් කළ විදේශවල වෙළඳ ලකුණු ලියාපදිංචියට ඉදිරිපත් කළ ඉල්ලුම්පත් සංඛ්‍යාවේ වාර්ෂික සාමාන්‍යය 300%කටත් වඩා ඉහළ යාමක් පෙන්වීය (උදා. 1996-2005 කාලය තුළ ඉල්ලුම්පත් 43ක සාමාන්‍යයක සිට 2006-2015 කාලය තුළ ඉල්ලුම්පත් 184ක සාමාන්‍ය-

යක් දක්වා).

ලෝ.බු.දේ.කා. මඟින් පළකල දත්තවලින් පෙන්නුම් කෙරෙන්නේ රටවල් 31ක් තුළ වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීම් සඳහා ශ්‍රී ලාංකික සමාගම් ඉල්ලුම් කර ඇති බවයි. මේ අතුරින් රටවල් 21ක් මැඩ්රිඩ් ප්‍රොටොකෝලයේ සාමාජික රටවල් වේ. මෙම සංඛ්‍යා ලේඛන කියාපාන්නේ ශ්‍රී ලංකාව මැඩ්රිඩ් ප්‍රොටොකෝලය හා එක්වීමෙන් ශ්‍රී ලාංකික ව්‍යාපාරවලට කැපී පෙනෙන ප්‍රතිලාභ අත් වන බවයි.

**විදේශයන්හි වෙළඳ ලකුණු ලියාපදිංචියට දිගු කාලයක් ගතවන අතර, එය දුෂ්කර සහ පිරිවැය අධික කටයුත්තකි.**

වර්තමානයේ දී තම වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීමට බලාපොරොත්තු වන ශ්‍රී ලාංකික ව්‍යාපාර, ලියාපදිංචිය සිදු කිරීමට අපේක්ෂා කරන සෑම රටක් තුළම ඇති බුද්ධිමය දේපළ කාර්යාල වෙත වෙන වෙනම ඉල්ලුම්පත් යොමු කළ යුතුය. එසේම එම ඉල්ලුම්පත් ඒ ඒ රටෙහි භාෂාවන්ගෙන් පිළයෙළ කළ යුතු අතර ලියාපදිංචිය සදහා ඒ ඒ රටෙහි නීතිඥයන්ගේ සහායද ලබා ගැනීමට විශාල මුදලක් වියදම් කිරීමටද සිදුවේ. එනිසා මැඩ්රිඩ් ප්‍රොටොකෝලය හරහා විදේශ රටවල වෙළඳ ලකුණු ලියාපදිංචිය සිදු කිරීමට සාපේක්ෂව වත්මන් ක්‍රියාවලිය වඩා වියදම්කාරී වේ. එමෙන්ම වර්තමාන ක්‍රමය තුළදී ලියාපදිංචිය සඳහා ගතවන කාලය ස්ථාවර නොවන අතර, එය රටකින් රටකට වෙනස් වේ. පුද්ගලික අංශයන්ගෙන් ලැබෙන තොරතුරු අනුව මෙම ක්‍රියාවලියට සාමාන්‍යයෙන් වසර 2 සිට 5 දක්වා කාලයක් දළ වශයෙන් ගත වේ.

**වෙළඳ ලකුණු විදේශයන්හි ලියාපදිංචි කිරීමේ දී මුහුණදීමට සිදුවන දුෂ්කරතා මැඩ්රිඩ් ප්‍රොටොකෝලයේ සාමාජිකත්වය හරහා අවම කරගත හැක.**

ශ්‍රී ලාංකික ව්‍යාපාරවලට විදේශ රටවල වෙළඳ ලකුණු ලියාපදිංචියට දැනට යෑමට ඇති දුෂ්කර මාර්ගයට සාපේක්ෂව මැඩ්රිඩ් ප්‍රොටොකෝලය සරල මගක් වේ. මැඩ්රිඩ් හරහා යෑමේදී රටවල් කිහිපයක සිය වෙළඳ ලකුණ ලියාපදිංචිය සඳහා ශ්‍රී ලාංකික ව්‍යාපාර විසින් එක් භාෂාවකින් පමණක් පිළියෙළ කරන ලද එක් ඉල්ලුම්පතක් පමණක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වන අතර, ගෙවිය යුතු වන්නේ එක් ගාස්තු කාණ්ඩයක් පමණක් වේ. එසේම වෙළඳ ලකුණක් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ දැනුම්දීම වසර 1-1.5 ක ස්ථාවර කාල රාමුවක් තුළ සිදු කිරීමට සියලු සාමාජික රටවල් බැඳී සිටී. තවද ඒ ඒ රටෙහි නීතිඥවරුන්ගේ සේවාව වෙන වෙනම ලබා ගැනීම අවශ්‍ය නොවන නිසා නීතිඥ ගාස්තු වශයෙන් මුදල් වැය කිරීමට ද අවශ්‍ය නොවේ.

**දේශීය ඉල්ලුම්පත් අන්තර්ජාතික ලියාපදිංචිය සඳහා පළමු පියවර**


සිය රට තුළ වෙළඳ ලකුණ ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කර තිබීම, මැඩ්රිඩ් ප්‍රොටොකෝලය යටතේ අන්තර්ජාතිකව ලියාපදිංචි කිරීමේ ඉල්ලුම්පතක් ඉදිරිපත් කිරීම සඳහා පූර්ව අවශ්‍යතාවයකි. දේශීය ඉල්ලුම්පත පිළිගැනීමට ලක්වීම අපේක්ෂාවෙන් සිටින කාලය අතරතුර අන්තර්ජාතික ඉල්ලුම්පතක් ඉදිරිපත් කළ හැකිය. කෙසේවෙතත්, දේශීය ඉල්ලුම්පත තහවුරු නොවී තිබිය දී මැඩ්රිඩ් පද්ධතිය හරහා ඉල්ලුම්පත් ඉදිරිපත් කරන ව්‍යාපාර කේන්ද්‍රීය ප්‍රහාරයකට (central attack) මුහුණදීමට සිදුවීමේ අවදානමට ලක්වේ. කේන්ද්‍රීය ප්‍රහාරයක් යනු, සිය රට තුළ වෙළඳ ලකුණ ලියාපදිංචිය අවලංගු වූ හෝ ප්‍රතික්ෂේප වූ අවස්ථාවකදී, අන්තර්ජාතික ඉල්ලුම් පත පදනම් කරගත් සියලු විදේශීය ලියාපදිංචි කිරීම් ද ස්වයංක්‍රීයව අවලංගු වීමේ තත්වයයි.[1]

**ශ්‍රී ලංකාව තුළ වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීම දිගු කාලයක් වැයවන දුෂ්කර කටයුත්තකි.**

ශ්‍රී ලංකාව තුළ සිය වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීම දුෂ්කර කාර්යයකි. දැනට ලියාපදිංචි වෙළඳ ලකුණු අන්තර්ජාලය ආශ්‍රිතව පිරික්සීමේ පහසුකමක් ජා.බු.දේ.කා. සතුව නොපවතී. එසේම ශ්‍රී ලංකාවේ වෙළඳ ලකුණු පිළිබඳව හා වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව එම ආයතනයේ වෙබ් අඩවිය තුළ ඇත්තේ සීමිත තොරතුරු ප්‍රමාණයකි. එබැවින්, වෙළඳ ලකුණු හිමිකරුවන් තමන් ලියාපදිංචි කිරීමට බලාපොරොත්තු වන වෙළඳ ලකුණ දැනටමත් වෙන අයෙකු විසින් ලියාපදිංචි කර ඇත්දැයි දැන ගැනීමට පුද්ගලිකවම හෝ නියෝජිතයෙකු හරහා හෝ ජා.බු.දේ.කා.ට ගොස් සොයා බැලිය යුතුව තිබේ. ඉන්දියාව හා තුර්කිය වැනි රටවල බුද්ධිමය දේපළ කාර්යාලය (බු.දේ.කා.) සතුව අන්තර්ජාලය ආශ්‍රිතව දැනට ලියාපදිංචි කර ඇති වෙළඳ ලකුණු පිරික්සුම් කිරීමේ පහසුකම් පවතී. ඉන් බු.දේ.කා. වෙත යෑමේ දී ගතවන පිරිවැය සහ කාලය ඉතිරිකර ගැනීමට ද හැකි වේ.


ශ්‍රී ලංකාව තුළ වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියද බොහෝ කල්ගත වන සුලුය. පුද්ගලික අංශයේ ව්‍යාපාර වෙතින් ලැබෙන තොරතුරුවලට අනුව ශ්‍රී ලංකාව තුළ වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීම සඳහා සාමාන්‍යයක් ලෙස වසර 3-5 දක්වා කාලයක් ගත වේ. එසේ වෙතත්, ලියාපදිංචිය තහවුරු කර ගැනීම සඳහා ගතවන කාලය ඇතැම් විට වසර 8-10ක් දක්වා වුවද

*1 World Intellectual Property Organization, Guide to the International Registration of Marks under the Madrid Agreement and the Madrid Protcol (Geneva: World Intellectual Property Organization, 2014): B.II.90-91.*




මූලාශ්‍රය - ලෝ.බු.දේ.කා. සංඛ්‍යාලේඛන

රූප සටහන 2:
වසරකට ලියාපදිංචි කරන ලද වෙළඳ ලකුණු සංඛ්‍යාව ඉල්ලුම්පත්‍ර වල ප්‍රතිශතයක් ලෙස




මූලාශ්‍රය - ලෝ.බු.දේ.කා. සංඛ්‍යාලේඛන

ශ්‍රී ලංකාව (2010-2015) තුළ දේශීය වෙළඳ ලකුණු ලියාපදිංචි කරන ඉල්ලුම්පත් සංඛ්‍යාවේ ඉහළ යෑමක් මෑත වසරවල දී දක්නට තිබුණද, වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීම් සංඛ්‍යාව එක තැන සිරවීමක් පෙනෙන්නට තිබේ (රූපය 1). සාමාන්‍යයක් වශයෙන් ගතහොත් වසරකට ජා.බු.දේ.කා. වෙත ලැබෙන සෑම දේශීය

වෙළඳ ලකුණු ඉල්ලුම්පත් 100කින්ම වාර්ෂිකව ලියාපදිංචි කෙරෙන්නේ 14ක් පමණි. ඊට පරස්පරව බල්ගේරියාව, පිලිපීනය, වියට්නාමය හා තුර්කිය යන රටවල් මැඩ්රිඩ් ප්‍රොටොකෝලය සමඟ එක් වීමට

පෙර, වසරකට දේශීය ඉල්ලුම්කරුවන් වෙතින් ලැබුණු සෑම ඉල්ලුම්පත් සියයකින්ම 50කට වඩා වැඩි ලියාපදිංචි කිරීම් සංඛ්‍යාවක් සිදු කර තිබිණි (රූපය 2).

**මැඩ්රිඩයෙන් පසු විදේශීය අයදුම්පත් සංඛ්‍යාව ඉහළ යාම හමුවේ දේශීය අයදුම්පත් සැකසුම් කිරීම තවදුරටත් ප්‍රමාදයට ලක් විය හැකිය.**

මැඩ්රිඩ් ප්‍රොටොකෝලය හා එක් වූ රටවල අත්දැකීම් මඟින් ඉඟි කෙරෙන්නේ, ප්‍රොටොකෝලය යටතේ වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීමේ සාපේක්ෂ පහසුව හේතුවෙන්, ප්‍රොටොකෝලයට ආබද්ධ වූ රට වෙත ලැබෙන විදේශීය වෙළඳ ලකුණු ඉල්ලුම්පත් සංඛ්‍යාව ආරම්භයේ දී තීව්‍ර ලෙස ඉහළ යන බවයි. නිදසුනක් ලෙස, මැඩ්රිඩ් ප්‍රොටෝකෝලය සමග එක් වීමට පෙර වසර 5ට සාපේක්ෂව, එක්වීමෙන් පසු වසර 5 තුළ දී බු.දේ.කාර්යාල වෙත ලැබුණු වාර්ෂික විදේශීය ඉල්ලුම්පත් සංඛ්‍යාව වියට්නාමයේ 83%කින් ද, පිලිපීනයේ 51%කින් ද, තුර්කියේ 76%කින් ද ඉහළ ගියේ ය.

මෙසේ මැඩ්රිඩ් සාමාජිකත්වය සමග ඒ හරහා එන විදේශ අයදුම්පත් ඉහළ යාමට ඇති ඉඩ ප්‍රස්ථාව ශ්‍රී ලංකාව වෙත සැලකිය යුතු අභියෝගයක් එල්ල කරයි. එහි සාමාජික රටක් ලෙස, වර්තමානයේ දී විදේශ ඉල්ලුම්පත් සැකසුම් කිරීමට ගන්නා වසර 3-5 දක්වා වූ කාලය වසර 1.5ක ස්ථිර කාල රාමුවකට අඩු කර ගැනීමටද ශ්‍රී ලංකාව බැඳී සිටී. එවැනි නීතිමය බැඳීමක් දේශීය ඉල්ලුම්පතක් සැකසීම සඳහා නොමැති තත්ත්වයක් යටතේ මැඩ්රිඩ් ක්‍රමයට අනුගතවීම සහ දේශීය ඉල්ලුම්පත් අහබවා විදේශීය ඉල්ලුම්පත් සැකසීමට ප්‍රමුඛතාවයක් දීමට ඇති සම්භාවිතාව වැඩිය. මේ හේතුවෙන් දේශීය ඉල්ලුම්පත් සැකසුම් කිරීම තවදුරටත් පමා වීමටත්, එමඟින් දේශීය ඉල්ලුම්පත් සංඛ්‍යාව හා ලියාපදිංචි කිරීම් සංඛ්‍යාව අතර දැනටමත් පවතින විශාල පරතරය තවත් පුළුල් වීමටත් ඇති ඉඩ කඩ වැඩි වේ.

විදේශීය ඉල්ලුම්පත් සංඛ්‍යාව ඉහළ ගිය ද, සාමාජිකත්වය ලබා ගැනීමෙන් පසු ඇතිවිය හැකි මෙවැනි ගැටලු හඳුනාගෙන ඒවා නිරාකරණය කර ගැනීමට පියවර

ගැනීම මගින් දේශීය ඉල්ලුම්පත් කෙරෙහි එල්ලවිය හැකි අහිතකර බලපෑම සමනය කර ගත හැකි වනු ඇත. අනෙක් රටවල අත්දැකීම්වලින් මෙම ශක්‍යතාවය පෙන්නුම් කෙරේ. නිදසුනක් ලෙස මැඩ්රිඩ් ප්‍රොටොකෝලයේ සාමාජිකත්වය ලබාගැනීමෙන් පසුව ඇති වූ විදේශ ඉල්ලුම්පත් සංඛ්‍යාවේ ඉහළ යාම මධ්‍යයේ වුවද, වියට්නාමය, පිලිපීනය හා තුර්කියේ දේශීය ඉල්ලුම්පත් හා ලියාපදිංචි කිරීම් සංඛ්‍යාවේ වැඩි වීමක් දැකිය හැකි විය. සාමාජිකත්වයට පෙර පස් වසර සමග සැසඳීමේ දී, සාමාජිකත්වයෙන් පසු පළමු පස් වසර තුළ දේශීය ඉල්ලුම්පත් සංඛ්‍යාවේ වාර්ෂික සාමාන්‍යය වියට් නාමයේ 140%කින් ද, පිලිපීනයේ 45%කින් ද, තුර්කියේ 67%කින් ද ඉහළ නැංවිණි. එනිසා ශ්‍රී ලංකාව මැඩ්රිඩ් සාමාජිකත්වය ලබාගැනීමට යාමේදී අනෙකුත් රටවල අත්දැකීම්වලින් පාඩම් උගනිමින් ගැටලු මැඩලීමට ඒ රටවල් ගත් පියවරයන් අනුගමනය කිරීම වැදගත් වේ.

අනෙක් රටවල් සමඟ සැසඳීමේ දී ශ්‍රී ලංකාව සාමාජිකත්වයට පෙර මුහුණ දෙන අභියෝගයන් වඩා වැඩිය. ඊට හේතුව, ශ්‍රී ලංකාව හා සම ආදායම් මට්ටමේ පවතින අනෙක් රටවල් සාමාජිකත්වය ලැබීමට පෙර වෙළඳ ලකුණු ලියාපදිංචියේදී දක්වන ලද කාර්ය සාධනයට වඩා බොහෝසෙයින් පසුගාමී තැනක ශ්‍රී ලංකාව දැනට පසුවන බැවිනි. එබැවින් අනෙක් රටවලට සාපේක්ෂව ශ්‍රී ලංකාව මෙහිදී අදාල ගැටලු විසඳීමට එම රටවලට වඩා වැඩි පරිශ්‍රමයක් දැරිය යුතු වනු ඇත.

**මැඩ්රිඩ් සාමාජිකත්වයෙන් උපරිම ප්‍රතිලාභ ලැබීමට නම්, ශ්‍රී ලංකාව තුළ පවතින ගැටළුව විසඳීම සඳහා ප්‍රමුඛත්වයක් ලබා දිය යුතුය.**

ලෝ.බු.දේ.කා. විසින් සැකෙවින් සකසන ලද මැඩ්රිඩ් ප්‍රොටොකෝලයට සම්බන්ධ වීමේ ක්‍රියාවලිය තුළ, පළමු පියවරක් ලෙස ප්‍රධාන ක්ෂේත්‍ර 6ක් ආවරණය වන අන්දමින් සමාරම්භක ඇගයුමක් සිදු කරන ලෙස රටවලට නියම කෙරේ. එම ක්ෂේත්‍ර 6 නම්, නායකත්වය, නීති සම්පාදන ආයතන, ක්‍රියාපටිපාටි, තාක්‍ෂණය හා ප්‍රජාව යන ක්ෂේත්‍රයි. මෙම සමාරම්භක ඇගයීමෙන් පසු ඒ රට විසින් සාමාජිකත්වය ලැබීමට පෙර විසඳා ගත යුතු ගැටලු සියල්ල හඳුනා ගනිමින් සැලැස්මක් පිළියෙල කර ගත යුතු වේ.

ගැටලු හඳුනා ගැනීම සඳහාත්, විසඳුම් සෙවීම සඳහාත්, සියලු පාර්ශවකරුවන් ගොනු කර ගනිමින් ඔවුන්ගේ සහභාගිත්වයෙන් පවත්වන විවෘත උපදෙස් ලබාගැනීමේ ක්‍රියාවලියක් ඇති කර ගැනීම මෙහිදී වැදගත් වේ. සාමාජිකත්වය ලබා ගැනීම සඳහා යෝජනාව ඉදිරිපත් වී ඇත්තේ 2015 නොවැම්බරයේ වුවද, එවැනි ක්‍රියාවලියක් ගොඩ නඟා ගැනීමට ජා.බු.දේ.කා. මේ වනතෙක් අසමත් වී ඇති අතර, සාමාජිකත්වය ලබා ගැනීමට අදළව සිදු වී ඇති ප්‍රගතිය පිළිබඳව වර්තමානයේ දී පාර්ශවකරුවන් දැනුවත් වී නොමැත.

**නිර්දේශයන්**

පහත ඉදිරිපත් කෙරෙන නිර්දේශයන් සැකසී ඇත්තේ මෙම විශ්ලේෂණය තුළ හඳුනා ගැනුණු මූලික ගැටලු වලට ආමන්ත්‍රණය කෙරෙන පරිදි ය. මේ නිර්දේශයන්ගේ අරමුණ වන්නේ ජා.බු.දේ.කා. සපයන සේවාවල ගුණාත්මකභාවය වඩාත් පිළිගත හැකි මට්ටමකට ගෙන ඒමත්, ශ්‍රී ලංකාවේ වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියේ කාර්යක්‍ෂමතාව වැඩි දියුණු කිරීමත් ය.

1. පාර්ලිමේන්තුව හා අදළ අමාත්‍යංශය විසින් කාර්තුවක් පාසා සිදු කරන කාර්ය සාධන සමාලෝචනයකට ජා.බු.දේ.කා. නතු කිරීම.

වගවීමකින් හා කාර්ය සාධන අධීක්‍ෂණයකින් තොරවූ විට, රාජ්‍ය ආයතනවලින් සපයන සේවාවල අකාර්යක්ෂම බව සහ යෝජිත ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීමේ පවතින දුර්වලතා කිසිවෙකුගේ අවධානයට හසු නොවීමට තිබෙන ඉඩකඩ වැඩිය. වර්තමාන රජය විසින් පිහිටුවන ලද නව පාර්ලිමේන්තු අධීක්‍ෂණ කමිටු ශ්‍රී ලංකාවේ මෙම ගැටලු ව සඳහා අර්ධ ප්‍රතිචාරයකි. තමන්ගේ බල සීමාව තුළ පවතින විෂයන්ට අදළ සියලු කරුණු පරීක්‍ෂා කිරීමේ අධිකාරී බලය මෙම අධීක්‍ෂණ කමිටු සතුය.

ජා.බු.දේ.කා. පවතින්නේ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ වාණිජ අංශය යටතේ ය. එබැවින් අමාත්‍යාංශයට අමතරව, ව්‍යාපාර හා වාණිජ්‍යය පිළිබඳ ආංශික අධීක්‍ෂණ කාරක සභාවට ජා.බු.දේ.කා.යේ කාර්ය සාධන සමාලෝචනයන් සඳහා විධිමත් චක්‍රයක් ස්ථාපිත කිරීම වැදගත්ය.

පාර්ලිමේන්තුව හා අමාත්‍යංශය එක් වී මූලික කාර්යසාධන දර්ශකයන් (KPI) හඳුන්වා දීම මගින් ජා.බු.දේ.කා.හි වගවීම ඉහළ තලයකට නංවා ලීමෙන් ශ්‍රී ලංකාව වෙළඳ ලකුණු ලියාපදිංචිය අන්තර්ජාතිකව පිළිගත් කාර්ය සාධන ප්‍රමිතීන්ගේ මට්ටමට ඔසවා තැබීමට හැකි වනු ඇත. මෙම කාර්යසාධන දර්ශක සෑම කාර්තුවක්

පාසාම ඇගයීමට ලක් කිරීම තුලින් ආයතනය ලබාගත් ප්‍රගතිය වාර්තා කර ගැනීමටත්, සේවා වල ගුණාත්මක-භාවය පිළිගත් මට්මටක් කරා කඩිනමින් ගෙන ඒමටත් හැකිවනු ඇත. එසේම නිරන්තර ඇගයීමේ ක්‍රියා-වලිය තුලින් ජා.බු.දේ.කා.ට සිය කාර්යසාධනය පහළ මට්ටමක පැවතීමට හේතු වන ගැටලු හඳුනා ගැනීමට උපකාරී වනු ඇත. එම ගින් එම ගැටලු වලට අප්‍රමාදීව විසඳුම් ලබා දීමට රජයට හැකි වනු ඇත. උදහරණයක් ලෙස, ජා.බු.දේ.කා.හි ප්‍රධානී විසින් තම කාර්යාලයේ පවතින සේවක හිගය ප්‍රධාන ගැටලුවක් බව ප්‍රසිද්-ධියේම ප්‍රකාශ කර තිබේ.

2. දැනට ලියාපදිංචි කරන ලද සියලු වෙළඳ ලකුණු වල තොරතුරු ඇතුලත් අන්තර්ජාලය හරහා පිරික්සුම් සිදු කළ හැකි, විවෘත දත්ත ගබඩාවක් පවත්වා ගෙන යාම.

රාජ්‍ය ආයතන විසින් සපයන කාර්යක්‍ෂමතාවය ඉහළ නංවාලීමේ දී තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණයට විශාල කාර්ය භාරයක් ඉටු කළ හැකිය. බොහෝ රට-වල් විසින් ස්ථාපිත කර තිබෙන ලියාපදිංචි වී ඇති සියලු වෙළඳ ලකුවල තොරතුරු ඇතුළත්, අන්තර්ජාලය හරහා පිරික්සුම් සිදු කළ හැකි විවෘත දත්ත ගබඩාවන් උදාහරණයක් ලෙස දැක්විය හැක.

එවැනි දත්ත ගබඩාවක් තිබීමෙන්, ව්‍යාපාරවලට දැනට ලියාපදිංචි වෙළඳ ලකුණු පිළිබඳ තොරතුරු ලබා ගැනීම සඳහා අදාළ රාජ්‍ය ආයතන වලට යාමට වැය-වන කාලය හා මුදල් ඉතිරි කර ගත හැකි වේ.

මෙමගින් දැනටමත් ලියාපදිංචි වී ඇති වෙළඳ ලකුණු තම භාණ්ඩ සහ සේවා සඳහා තෝරා ගැනීම පහසුවෙ-න් වලක්වා ගැනීමට ව්‍යාපාරවලට හැකියාව ලැබේ. තම වෙළඳ ලකුණු ලියාපදිංචිය ප්‍රතික්ෂේප වීමට ඇති ඉඩ ප්‍රස්ථා එමඟින් අඩු කර ගත හැකි වේ.

මෙම අධ්‍යයනය වෙරිටේ පර්යේෂණ ආයතනයේ ආර්ථික විද්‍යා පර්යේෂණ කණ්ඩායම විසින් සිදු කරන ලදී. අනෝජ් ඒකනායක, සුභාෂිනි අබේසිංහ, සබ්රීනා එසුෆලි යන අයගෙන් මෙම පර්යේෂණ කණ්ඩායම සමන්විත විය. නිශාන් ද මෙල් සහ ගෙහාන් ගුණතිලක විසින් මෙය සංස්කරණය කරන ලදී.